# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,891—1970 ජනවාරි 29 වැනි බ්‍රහස්පතින්ද—1970.1.29

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිඞ කරන ලදි.)


## IV වැනි කොටස—පළාත් පාලනය

(මෙහි වෙනම ගොනුකර ගතහැකි පරිදි සැම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන් වෙනම පිටු අංක යොද ඇත)


| | පිට | | පිට |
|---|---|---|---|
| පළාත් පාලන නිවේදන ... ... ... | 93 | ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | — |
| තනතුරු-ඇබෑර්තු ... ... ... | — | අය-වැය ලේඛන ... ... ... | 98 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | — | දේපල විකිණීම් ... ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... ... | 94 | මාර්ග කොමිටි දැන්වීම් ... ... ... | — |
| පළාත් පාලන සභා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් ... | 95 | විවිධ දැන්වීම් ... ... ... ... | 98 |


## පළාත් පාලන නිවේදන

ඇල්.ඩී.—බී. 67/36

### මාවතගම සුළු නගර සභාව

#### ප්‍රසිද්ධ රඟ දැක්වීම් ආඥාපනත

(176 වැනි අධිකාරය වන) ප්‍රසිද්ධ රඟ දැක්වීම් ආඥාපනතේ 3 වැනි වගන්තියෙන් පළාත් පාලන ඇමතිවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ඔහු විසින් පනවනු ලැබූ ව්‍යවස්ථාව.

ආර්. ප්‍රේමදාස,
පළාත් පාලන ඇමති.

1970.1.11 වැනි දින,
කොළඹදී ය.

#### ව්‍යවස්ථාව

(176 වැනි අධිකාරය වන) ප්‍රසිද්ධ රඟ දැක්වීමේ ආඥාපනතේ 3 වැනි වගන්තිය යටතේ පනවා 1919 අප්‍රේල් 4 වැනි දින අංක 7,004 දරන ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ 1943 අප්‍රේල් මස 9 වැනි දින අංක 9,108 දරන ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ ව්‍යවස්ථාවෙන් අන්තිම වරට සංශෝධිත ව්‍යවස්ථාවල අ3 වැනි ව්‍යවස්ථාව වෙනුවට පහත දැක්වෙන අලුත් ව්‍යවස්ථාව ආදේශ කිරීමෙන් මාවතගම සුළු නගර සභාවේ පරිපාලන සීමා ඇතුළත වූ ප්‍රදේශයට අදළවනතාක් දුර ඒ ව්‍යවස්ථා තව දුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

" අ 3 (1) ගාස්තු අයකර තැනැත්තන් ඇතුළු කරනු ලබන ප්‍රසිද්ධ රඟදැක්වීම් පැවැත්වීම සඳහා ගොඩනැගිල්ලක් හෝ ඉඩි කිරීමක් පාවිච්චි කිරීමට බලපත්‍රයක් ඉල්ලුම් කරන අයදුම්කරුවකු වෙත ඒ බලපත්‍රය නිකුත් කිරීමට ප්‍රථම ඔහු විසින් සභාවට පහත සඳහන් ප්‍රමාණයන් අනුව ගණන් බලනු ලැබූ මුදලක් ගෙවිය යුතුය :—

| | එක් දිනකට | | එක් මසකට | | (දෙසැම්බර් 31 වැනිදයින් අවසන් වන) එක් අවුරුද්දකට | |
|---|---|---|---|---|---|---|
| | රු. | ශ. | රු. | ශ. | රු. | ශ. |
| ආසන පහසුකම් සැපයෙන තැනැත්තන්ගේ ගණන 199 ට වැඩි නොවන කල්හි ... ... | 5 | 0 | ... 25 | 00 ... | 100 | 0 |
| ආසන පහසුකම් සැපයෙන තැනැත්තන්ගේ ගණන 199 ට වැඩි නමුත් 399ට වැඩි නොවන කල්හි ... | 10 | 0 | ... 50 | 0 ... | 300 | 0 |
| ආසන පහසුකම් සැපයෙන තැනැත්තන්ගේ ගණන 399 ට වැඩි නමුත් 499ට වැඩි නොවන කල්හි ... | 15 | 0 | ... 75 | 0 ... | 400 | 0 |
| ආසන පහසුකම් සැපයෙන තැනැත්තන්ගේ ගණන 499 ට වැඩි කල්හි... | 25 | 0 | ...100 | 0 ... | 500 | 0 |

1-561—70.1.29 දින අංක 14,891 දරන ගැසට් පත්‍රය

---

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

### විශෙෂ නිවේදනයයි

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දැක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සැම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශෙෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථෝක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ.

1968 දෙසැම්බර් මස 14 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

ඇල්.ඞී.—බී. 25/48

## තලවාකැලේ-ලිඳුල නගර සභාව

නගර සභා ආඥාපනත

### 1970 වර්ෂය සඳහා ජලය පිළිබඳ විශේෂ වරිපනම් බද්ද

(255 වැනි අධිකාරය වන) නගර සභා ආඥාපනතේ 130(ආ) වැනි වගන්තිය යටතේ සහ එකී වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, පළාත් පාලන ඇමතිවරයා විසින් දෙන ලද අනුමැතිය ඇතිව, අතුරු ව්‍යවස්ථා මගින් නියම කළහැකි සීමා කිරීම් හා නිදහස් කිරීම් වලට යටත්ව, තලවාකැලේ-ලිඳුල නගරය තුළ පිහිටි සියලුම නිශ්චල දේපළවල වාර්ෂික වටිනාකමින් සියයට හය බැගින් වූ ජලය පිළිබඳ විශේෂ වරිපනම් බද්දක් පිළිවෙළින් මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30 සහ දෙසැම්බර් 31 යන දිනයන්හි, ගෙවිය හැකි වනසේ 1970 වර්ෂය සඳහා තලවාකැලේ-ලිඳුල නගර සභාව විසින් පනවා ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඊ. ජී. ගුණවර්ධන,
පළාත් පාලන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970.1.13 වැනි දින,
කොළඹ දී ය.

1–531—70.1.29 දින අංක 14,891 දරන ගැසට් පත්‍රය

---

ඇල්.ඞී.—බී. 34/47.

## සුළු නගර සභා ආඥාපනත

### 1970 සඳහා කසළ ශෝධන විශේෂ වරිපනම් බද්ද

(256 වැනි අධිකාරය වන) සුළු නගර සභා ආඥාපනතෙහි 1:9 (ආ) වැනි වගන්තිය යටතේ සහ එකී වගන්තියෙන් පළාත් පාලන ඇමතිවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ඔහු විසින් දෙන ලද අනුමැතිය ඇතිව, අතුරු ව්‍යවස්ථාවලින් නියම කරනු ලැබිය හැකි සීමා කිරීම් සහ නිදහස් කිරීම් වලට යටත්ව, සමන්තුරෙයි සුළු නගරය තුළ පිහිටා තිබෙන සියළුම නිශ්චල දේපළවල වාර්ෂික වටිනාකමින් සියයට හතර බැගින් වූ කසල ශෝධන විශේෂ වරිපනම් බද්දක්, පිළිවෙළින් මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දිනයන්හි සමාන කොටස් හතරකින් ගෙවා අවසන් කළ හැකි අන්දමට 1970 වර්ෂය සඳහා සමන්තුරෙයි සුළු නගර සභාව විසින් පනවා ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඊ. ජී. ගුණවර්ධන,
පළාත් පාලන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970.1.13,
කොළඹ දී ය.

1–530—70.1.29 දින අංක 14,891 දරන ගැසට් පත්‍රය

---

# අතුරු ව්‍යවස්ථා

ඇල්. ඞී.—බී. 33/69

ඒ/වීසී/එල්/39/1.

## ගම්සභා ආඥාපනත

(257 වැනි අධිකාරය වන) ගම්සභා ආඥාපනතේ 42 වැනි වගන්තිය යටතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ මොරගොල්ලාගම ගම් ප්‍රදේශයේ ගම්සභාව විසින් පනවනු ලැබ ඒ වගන්තියෙන් තමා වෙත පැවරී තිබෙන බලතල ප්‍රකාර පළාත් පාලන ඇමතිවරයා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථාව.

ඊ. ජී. ගුණවර්ධන,
පළාත් පාලන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970 ජනවාරි 8 වන දින,
කොළඹ දී ය.

### වෙළඳ පොළවල් සහ පොළවල් පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

1. කුරුණෑගල දිස්ත්‍රික්කයේ මොරගොල්ලාගම ගම් ප්‍රදේශයේ ගම්සභාව විසින් පිළිගන්නා ලද වෙළඳ පොළවල් හා පොළවල් පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථාවල XXVII වැනි කොටසේ 1 වැනි අතුරු ව්‍යවස්ථාවේ කාර්යයන් සඳහා මොරගොල්ලාගම වෙළඳ පොළ සම්බන්ධයෙන් වූ වෙළඳ ප්‍රදේශය එකී වෙළඳ පොළේ සිට සැතපුම් බාගයක අර්ධ විෂ්කම්භ කවයක් ඇතුළත ප්‍රදේශය විය යුතුයි.

2. මොරගොල්ලාගම වෙළඳ පොළේ යම්කිසි බිම් ප්‍රමාණයක් හෝ වෙළඳ පිළක් පාවිච්චි කිරීම හෝ ප්‍රයෝජනයට ගැනීම වෙනුවෙන් පහත සඳහන් ප්‍රමාණයන් අනුව ගාස්තුවක් අය කළ යුතුය :—

| | | දිනකට ගාස්තුව රු. ශ. |
|---|---|---|
| (1) එක් එක් වෙළඳ පිළ සඳහා (ස්ථිර කාමරයක්) | ... | 1 0 |
| (2) එක් එක් තාවකාලික කාමරයක් සඳහා | ... | 50 |
| (3) හතරැස් අඩි 9 ට වැඩි නොවන එක් එක් බිම් ප්‍රමාණයක් සඳහා ... | ... | 25 |
| (4) හතරැස් අඩි 9 ට වැඩි මුත් හතරැස් අඩි 18 ට අඩු එක් එක් බිම් ප්‍රමාණයක් සඳහා | ... | 35 |
| (5) හතරැස් අඩි 18 ට වැඩි මුත් හතරැස් අඩි 36 ට අඩු බිම් ප්‍රමාණයක් සඳහා | ... | 50 |

1–701—70.1.29 දින අංක 14,891 දරන ගැසට් පත්‍රය

---

ඇල්.ඞී.—බී. 34/69

## ගම්සභා ආඥාපනත

(257 වෙනි අධිකාරය වන) ගම්සභා ආඥාපනතේ 42 වෙනි වගන්තිය යටතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ තිරගන් දහය බටහිර ගම් ප්‍රදේශයේ ගම්සභාව විසින් පනවනු ලැබ ඒ වගන්තියේ (3) වෙනි උප වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, පළාත් පාලන ඇමතිවරයා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථා.

ඊ. ජී. ගුණවර්ධන,
පළාත් පාලන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970. 1. 8 වන දින,
කොළඹ දී ය.

### අතුරු ව්‍යවස්ථා

### ගම්බද වෙළඳ පොළවල්

1. එක් එක් ගම්බද වෙළඳ පොළේ සිට සැතැපුම් එකක අර්ධ විෂ්කම්භයක් ඇති කවයක් ඇතුළත වූ ප්‍රදේශය එවැනි එක් එක් වෙළඳ පොළේ වෙළඳ ප්‍රදේශය හැටියට මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

2. සභාව විසින් පිහිටුවන ලද යම් ගම්බද වෙළඳ පොළක යම් කඩ කාමරයක්, කඩ බක්කියක් හෝ ඉඩ ප්‍රමාණයක් ප්‍රයෝජනයට ගන්නා වූ හෝ පාවිච්චි කරන්නාවූ සෑම තැනැත්තකු විසින් එසේ ප්‍රයෝජනයට ගැනීම හෝ පාවිච්චි කිරීම සඳහා මෙයට යාකොට ඇති උපලේඛණයේ සඳහන් ප්‍රමාණ අනුව වූ ගාස්තුවක් ගෙවිය යුතුයි.

### සංචාරක වෙළෙන්දෝ

3. (1) සභාපති විසින් ඒ සඳහා නිකුත් කරන ලද බලපත්‍රයක් පිට මිස, කිසිම තැනැත්තකු විසින් සංචාරක වෙළෙන්දෙකුගේ ව්‍යාපාරය ආරම්භ කිරීම හෝ කරගෙන යාම නොකළ යුතුය.

(2) සභාපති විසින් කලින් අවලංගු නොකරන ලද්දේ නම් (1) ඡේදය යටතේ නිකුත් කරනු ලැබූ සෑම බල පත්‍රයක් එය නිකුත් කරන ලද අවුරුද්දේ දෙසැම්බර් මාසයේ තිස් එක් වෙනි දිනට අවසාන විය යුතුය.

(3) මේ අතුරු ව්‍යවස්ථාවල—

"සභාපති" යන්නෙන් සභාවේ "සභාපති" අදහස් වේ ; සහ

"සභාව" යන්නෙන් කුරුණෑගල දිස්ත්‍රික්කයේ තිරගන් දහය බටහිර ගම් ප්‍රදේශයේ ගම්සභාව අදහස් වේ.

උපලේඛනය

| | දිනක ගාස්තු රු. ශ. |
|---|---|
| (1) වෙළඳ පොළ ගොඩනැගිල්ල තුල හතරැස් අඩි 50 කට වැඩි නොවන කඩ කාමරයක්, කඩ බක්කියක් හෝ ඉඩ ප්‍රමාණයක් සඳහා ... | 0 50 |
| (2) වෙළඳ පොළ භූමියෙහි කඩ කාමරයක් සඳහා එවැනි කඩ කාමරයක්— | |
| (අ) හතරැස් අඩි 30 කට වැඩි නොවන විට ... | 0 35 |
| (ආ) හතරැස් අඩි 30 කට වැඩි වන එහෙත් හතරැස් අඩි 50 කට වැඩි නොවන විට ... | 0 50 |
| (ඇ) හතරැස් අඩි 50 කට වැඩිවන එහෙත් හතරැස් අඩි 100 කට, වැඩි නොවන විට ... | 0 75 |
| (3) වෙළඳ පොළ භූමියෙහි හතරැස් අඩි 100 කට වැඩි නොවන කඩ කාමරයක්, කඩ බක්කියක්, හෝ ඉඩ ප්‍රමාණයක් සඳහා ... ... | 0 75 |
| (4) එළිමහන් බිම කඩ බක්කියක්, හෝ ඉඩ ප්‍රමාණයක් සඳහා එවැනි කඩ බක්කියක් හෝ ඉඩ ප්‍රමාණය— | |
| (අ) හතරැස් අඩි 9 කට වැඩි නොවන විට ... | 0 05 |
| (ආ) හතරැස් අඩි 9 කට වැඩි වන එහෙත් හතරැස් අඩි 25 කට වැඩි නොවන විට... | 0 15 |
| (ඇ) හතරැස් අඩි 25 කට වැඩි වන එහෙත් හතරැස් අඩි 50 කට වැඩි නොවන විට... | 0 30 |
| (ඈ) හතරැස් අඩි 50 කට වැඩි වන එහෙත් හතරැස් අඩි 100 කට, වැඩි නොවන විට... | 0 60 |

1–562—70.1.29 දින අංක 14,891 දරන ගැසට් පත්‍රය

# පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම්

## ප්‍රාදේශීය බලමණ්ඩල ඡන්ද විමසීම් ආඥාපනත (262 වැනි අධිකාරය)

### කුරුණෑගල දිස්ත්‍රික්කය

### පිලැස්ස ගම් සභාව

ප්‍රාදේශීය බලමණ්ඩල ඡන්ද විමසීම් ආඥාපනතේ (262 වැනි අධිකාරය වන) 36 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලබන්නේ පිලැස්ස ගම් සභාවේ අංක 2 දරණ කොට්ඨාශය වෙනුවෙන් පෙනී සිටීම සඳහා, රත්නායක මුදියන්සේලාගේ රත්නායක බන්ඩා මහතා ඡන්දයෙන් තෝරා පත්කර ගන්නට යෙදුන බවය.

ඊ. ඇෆ්. ඩයස් අබේසිංහ,
මැතිවරණ කොමසාරිස්,
(ප්‍රාදේශීය බලමණ්ඩල)

1970 ජනවාරි මස 10 වැනි දින,
කොළඹ දී ය.

1–567—70.1.29 දින අංක 14,891 දරන ගැසට් පත්‍රය

## ප්‍රාදේශීය බලමණ්ඩල ඡන්ද විමසීම් ආඥාපනත (262 වැනි අධිකාරය)

ප්‍රාදේශීය බලමණ්ඩල ඡන්ද විමසීම් ආඥාපනතේ (262 වැනි අධිකාරය වන) 66 (2) වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙනු ලබන්නේ මෙහි පහත උපලේඛනයේ නම් සඳහන් අපෙක්ෂකයින් ඔවුන්ගේ නම්වලට කෙලින් ඇති ඒ ඒ කොට්ඨාශයේ නියෝජිතයන් වශයෙන් පෙනී සිටීම සඳහා තෝරා පත් කරන්නට යෙදුන බවය.

ඊ. ඇෆ්. ඩයස් අබේසිංහ,
මැතිවරණ කොමසාරිස්.
(ප්‍රාදේශීය බලමණ්ඩල)

1970 ජනවාරි මස 10 වැනි දින,
කොළඹ දී ය.

උපලේඛනය

| කොට්ඨාශ අංකය | අපෙක්ෂකයාගේ නම |
|---|---|
| | **මාතර දිස්ත්‍රික්කය** |
| | **ගොඩපිටිය ගම් සභාව** |
| 3 | ... කොළඹ ආරච්චිගේ පියදාස |
| | **යාපනය දිස්ත්‍රික්කය** |
| | **චූලිපුරම් ගම් සභාව** |
| 2 | ... වයිතිලිංගම් අම්ර්තලිංගම් |
| | **අරාලි ගම් සභාව** |
| 8 | ... මාරියන් නඩරාජා |
| | **කුරුණෑගල දිස්ත්‍රික්කය** |
| | **හමන්ගල්ල ගම් සභාව** |
| 6 | ... රාමනායක කංකානමලාගේ ඩිංගිරි බංඩා මෛත්‍රිපාල |
| | **පොතුහැර ගම් සභාව** |
| 5 | ... දිවාකර මොහොට්ටාලලාගේ ගුණරත්න බණ්ඩා |

1–563—70.1.29 දින අංක 14,891 දරන ගැසට් පත්‍රය

# අය-වැය ලේඛන

## නිවැරදි කිරීමයි

### 1969 අය–වැය ලේඛනය

### කුලියාපිටිය නගර සභාව

1969.12.12 වැනි දින අංක 14,884 දරණ IV වැනි කාණ්ඩයේ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ අංක 1110 දරණ පිටුවෙහි පළ වූ මුදල් හුවමාරු ඉල්ලුම් පත්‍රයෙහි අතිරික්තය යටතේ වූ ඊ.1. පී. යනුවෙන් සඳහන් විය යුතු වැය ශීර්ෂය ඊ.1. ජී. යනුවෙන් වැරදීමකින් සඳහන් වී තිබේ. එම වැය ශීර්ෂය පමණක් පහත සඳහන් පරිදි නිවැරදි විය යුතුයි :—

**වැරදීම**

අතිරික්තය

| ශීර්ෂය හා අනුශීර්ෂය | රු. ශ. |
|---|---|
| ඊ.—මහජන සෞඛ්‍යය :— | |
| 1. සාමාන්‍ය— | |
| (ජී) විවාහ දීමනා ... ... ... | 28 0 |

**නිවැරදි කිරීම**

අතිරික්තය

| ශීර්ෂය හා අනුශීර්ෂය | රු. ශ. |
|---|---|
| ඊ.—මහජන සෞඛ්‍යය :— | |
| 1. සාමාන්‍ය— | |
| (පී) විවාහ දීමනා ... ... ... | 28 0 |

ලයනල් ජයතිලක,
කුලියාපිටිය නගර සභාවේ සභාපති.

4.1.70.

1-556—70.1.29 දින අංක 14,891 දරන ගැසට් පත්‍රය

## හැඳල සුළු නගර සභාව

### සුළු නගර සභා මුදල් රෙගුලාසි අංක 40 (II) යටතේ ඉල්ලීම—1969 අය–වැය ලේඛනය

පහත දක්වෙන වැය ශීර්ෂය යටතේ ඉතිරි වේ යයි ගණන් බලන ලද මුදල, වැය ඉක්මවා යන ශීර්ෂයන්ට මෙහි දක්වෙන පරිදි මුදල් මාරු කිරීමට 1969.12.21 දින අංක 5 (3) දරණ යෝජනාවෙන් හැඳල සුළු නගර සභාව විසින් සම්මත කර ගන්නා ලදී :—

| ඉතිරිවේයයි ගණන් බලන ලද මුදල් සහ වැය ශීර්ෂ | රු. | ශ. |
|---|---|---|
| ඩී.—1. (ඇන්) මාතෘ දරකාභිවෘද්ධි මධ්‍යස්ථානය ... | 151 | 73 |
| | 151 | 73 |

| වැඩිපුර වියදම් වේ යයි ගණන් බලන ලද මුදල් සහ වැය ශීර්ෂ | රු. | ශ. |
|---|---|---|
| ඒ.—1. (ඒ) ලේකම් ... ... ... | 80 | 25 |
| ඩී.—4. (ඒ) වේතන ... ... ... | 71 | 48 |
| | 151 | 73 |

1969 දෙසැම්බර් මස 27 වැනි දින,
සුළු නගර සභා කාර්යාලය,
හැඳල.

ඒ. ඩී. විල්බට්,
සභාපති,
හැඳල සුළු නගර සභාව.

අනුමත කරමි.

1970 ජනවාරි මස 16 වැනි දින,
පළාත් පාලන අමාත්‍යාංශයේ,
කොළඹ ප්‍රාදේශීය කාර්යාලය,
බම්බලපිටිය.

ඇම්. බී. සමරකෝන්,
පළාත් පාලන සහකාර කොමසාරිස් (කො.දි.).

1–538—70.1.29 දින අංක 14,891 දරන ගැසට් පත්‍රය

---

## පිළියන්දල උප නගර සභාව

### මුදල් රෙගුලාසි අංක 40 (II) යටතේ කෙරෙන අයදුම් පත්‍රය

### 1969 අය-වැය ලේඛනය

1969 අය–වැය ලේඛනයේ මුදල් ශේෂ වේ යයි ගණන් බලා ඇති වැය ශීර්ෂයන්ගෙන් වැය ඉක්මවා යන ශීර්ෂයන්ට මෙහි පහත දක්වා ඇති පරිදි මුදල් මාරු කිරීමට තීරණය කරන ලදී:—

| ඉතිරි මුදල් වැය ශීර්ෂය | රු. | ශ. |
|---|---|---|
| ඒ.—1. (ජී) ජීවනාධාර හා විශේෂ ජීවනාධාර ... | 2,214 | 0 |
| ඒ.—1. (එච්) අතුරු දීමනා ... ... | 3,792 | 0 |
| ඒ.—2. (ඒ) දීමනා ... ... ... | 400 | 0 |
| බී.—13. ජීවනාධාර හා විශේෂ ජීවනාධාර ... | 786 | 0 |
| සී.—8. ජීවනාධාර හා විශේෂ ජීවනාධාර ... | 171 | 0 |
| ඩී.—1. (ඕ) ජීවනාධාර හා විශේෂ ජීවනාධාර ... | 249 | 0 |
| ඩී.—2. (ඊ) ජීවනාධාර හා විශේෂ ජීවනාධාර ... | 2,683 | 0 |
| ඩී.—3. (එච්) ජීවනාධාර හා විශේෂ ජීවනාධාර ... | 845 | 0 |
| ඩී.—7. (එච්) ජීවනාධාර හා විශේෂ ජීවනාධාර ... | 599 | 0 |
| | 11,739 | 0 |

| වැඩිපුර වියදම් වැය ශීර්ෂය | රු. | ශ. |
|---|---|---|
| ඒ.—1. (ඒ) ලේකම් ... ... ... | 330 | 0 |
| ඒ.—1. (බී) ලිපිකරු මණ්ඩලය ... ... | 1,435 | 0 |
| ඒ.—1. (සී) ආදායම් පරීක්ෂක ... ... | 360 | 0 |
| ඒ.—1. (ඩී) කාර්යාල කාර්ය සහායක ... ... | 191 | 0 |
| ඒ.—1. (අයි) විවාහ දීමනාව ... ... | 405 | 0 |
| ඒ.—2. (සී) අයකැමි කම්වුටු මිළ ... ... | 100 | 0 |
| ඒ.—2. (ඇෆ්) ලිපි ද්‍රව්‍ය, මුද්‍රණ, ප්‍රකාශන සහ කාර්යාලීය වියදම් ... ... ... | 284 | 0 |
| ඒ.—4. ආධාර හා දීමනා ... ... | 125 | 0 |
| බී.—1. (සී) කම්කරුවන්ට ... ... | 1,354 | 0 |
| බී.—14. විවාහ දීමනාව ... ... | 30 | 0 |
| සී.—1, වේතන ... ... | 280 | 0 |
| සී.—9. විවාහ දීමනාව ... ... | 15 | 0 |
| ඩී.—1. (බී) දෛනික වැටුප් ... ... | 300 | 0 |
| ඩී.—2. (ඒ) වේතන ... ... | 4,500 | 0 |
| ඩී.—2. (ඇෆ්) විවාහ දීමනාව ... ... | 30 | 0 |
| ඩී.—3. (ඒ) වැටුප් ... ... ... | 1,675 | 0 |
| ඩී.—3. (අයි) විවාහ දීමනාව ... ... | 60 | 0 |
| ඩී.—7. (ඩී) ඉදි කිරීම් ... ... | 250 | 0 |
| ඩී.—7. (අයි) විවාහ දීමනාව ... ... | 15 | 0 |
| | 11,739 | 0 |

### දෙවන කොටස—විදුලි අංශය

| | රු. | ශ. |
|---|---|---|
| ඊඩී.—1. (ඩී) විදුලි බලය මිළයට ගැනීම ... | 300 | 53 |
| ඊඩී.—4. (ඇෆ්) අතුරු දීමනාව ... ... | 1,235 | 29 |
| ඊඩී.—10. ජීවනාධාර හා විශේෂ ජීවනාධාර ... | 3,264 | 18 |
| | 4,800 | 0 |

| | රු. | ශ. |
|---|---|---|
| ඊඩී.—4. (බී) වැටුප් ... ... ... | 4,500 | 0 |
| ඊඩී.—4. (ජී) විවාහ දීමනාව ... ... | 300 | 0 |
| | 4,800 | 0 |

1969.12.26 දින රැස්වීමේ යෝජනා අංක 5.

1969 දෙසැම්බර් මස 26 වැනි දින,
පිළියන්දල උප නගර සභා කාර්යාලයේදීය.

සී. ඩී. ප්‍රේමරත්න,
සභාපති,
පිළියන්දල උප නගර සභාව.

1–541—70.1.29 දින අංක 14,891 දරන ගැසට් පත්‍රය

## තෙල්දෙණිය නගරය

### 1970 වර්ෂයේ දේපල බද්ද

(256 වැනි අධිකාරය වන) සුළු නගර සභා ආඥාපනතේ 159 වැනි වගන්තිය යටතේ 1969 වර්ෂයට පනවන ලද දේපල බද්ද, 1970 වර්ෂයටද එලෙසම පැනවීමට තෙල්දෙණිය නගරයේ විශේෂ කොමසාරිස් වන ලී. මු. සමරසිංහ වන මා විසින් තීරණය කර ඇති බවත්, මෙම නගර සීමාව තුළ පිහිටි සියලුම නිශ්චල දේපලවල වාර්ෂික වටිනාකමින් සියයට අට බැගින්වූ දේපල බද්ද පිළිවෙළින් 1970 මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30 සහ දෙසැම්බර් 31 යන දිනයන්හි සමාන කොටස් හතරකින් ගෙවා අවසාන කිරීමට හැකි බවත් මෙයින් ප්‍රකාශ කරනු ලැබේ.

ලී. මු. සමරසිංහ,
තෙල්දෙණිය නගරයේ විශේෂ කොමසාරිස්.

1970 ජනවාරි මස 4 වැනි දින,
තෙල්දෙණිය විශේෂ කොමසාරිස් කාර්යාලයේදී ය.

1–548—70.1.29 දින අංක 14,891 දරන ගැසට් පත්‍රය

---

## වාද්දුව සුළු නගර සභාව

### 1970 වර්ෂයට දේපල බද්ද

(256 වැනි අධිකාරය වන) සුළු නගර සභා ආඥාපනතෙහි 159 වැනි වගන්තිය යටතේ 1969 වර්ෂයට පනවන ලද දේපල බද්ද 1970 වර්ෂයටද එලෙසම පැනවීමට වාද්දුව සුළු නගර සභාව තීරණය කර ඇති බව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

මෙම සුළු නගර සභා සීමාව තුළ පිහිටා තිබෙන සියළුම නිශ්චල දේපලවල වාර්ෂික වටිනාකමින් සියයට අට බැගින් වූ දේපල බද්ද පිළිවෙළින් මාර්තු 31, ජූනි 30 සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 වෙනි දිනයන්හි සමාන කොටස් හතරකින් ගෙවා අවසන් කළ හැකි වේ.

ඇම්. ඩී. ඒ. ගුණතිලක,
සභාපති,
වාද්දුව උප නගර සභාව.

1970 ක්වූ ජනවාරි මස 13 වෙනි දින,
වාද්දුව උප නගර සභා කාර්යාලයේ දී ය.

1–551/1—70.1.29 දින අංක 14,891 දරන ගැසට් පත්‍රය

---

## වාද්දුව සුළු නගර සභාව

### 1970 වර්ෂයට වරිපනම් ලේඛන

1970 වර්ෂය සඳහා වාද්දුව සුළු නගර සභාවේ වරිපනම් ලේඛන දැනට සූදානම්ව ඇති බවත්, එම ලේඛන කාර්යාල වේලාවන්හිදී මහජනයාට පරීක්ෂාකර බැලීම සඳහා තබා ඇති බවත්, (256 වෙනි අධිකාරය වන) සුළු නගර සභා ආඥාපනතේ 165 වෙනි වගන්තියෙන් කියවෙන පරිදි (252 වෙනි අධිකාරය වන) නාගරික සභා ආඥාපනතේ 235 (1) දරණ වගන්තිය ප්‍රකාර මෙයින් දැනුම් දෙමි.

ඇම්. ඩී. ඒ. ගුණතිලක,
සභාපති,
වාද්දුව උප නගර සභාව.

1970 ජනවාරි 13 වෙනි දින,
වාද්දුව උප නගර සභා කාර්යාලයේ දී ය.

1–551/2—70.1.29 දින අංක 14,891 දරන ගැසට් පත්‍රය

---

## පැල්මඩුල්ල සුළු නගර සභාව

### සුළු නගර සභා මුදල් රෙගුලාසි 40 (II) යටතේ අයදුම්පත

| ඉතිරි කිරීමේ ශීර්ෂ | රු. | ශ. |
|---|---|---|
| ඒ.—සාමාන්‍ය :— | | |
| 1. නිළධාරීන්ගේ වැටුප්— | | |
| (ජී) ජීවනාධාර හා විශේෂ ජීවනාධාර ... | 1,777 | 89 |
| (අයි) අතුරු දීමනා ... ... ... | 573 | 20 |
| 2. සංස්ථා වියදම්— | | |
| (ඊ) නීති උපදේශක ගාස්තු ... ... | 200 | 0 |
| (අයි) නිවාඩු දින ගමන් ගාස්තු ... ... | 200 | 0 |
| බී.—මංමාවත් :— | | |
| 4. වීථි ආලෝක කිරීම් ... ... | 200 | 0 |
| සී.—නගර සභා ඉඩම් හා ගොඩනැගිලි :— | | |
| 8. ජීවනාධාර සහ වි. ජීවනාධාර ... ... | 202 | 84 |
| 9. අතුරු දීමනා ... ... ... | 70 | 0 |
| ඩී.—මහජන සෞඛ්‍යය :— | | |
| 2. කුණු කසළ ශෝධනය— | | |
| (ඊ) ජීවනාධාර සහ වි. ජීවනාධාර ... | 624 | 0 |
| (අෆ්) අතුරු දීමනා ... ... | 315 | 0 |
| 3. වැසිකිළි පවිත්‍ර කිරීම— | | |
| (එච්) ජීවනාධාර හා වි. ජීවනාධාර ... ... | 654 | 71 |
| (අයි) අතුරු දීමනා ... ... ... | 443 | 36 |
| එකතුව ... | 5,261 | 0 |

| අවශ්‍යව ඇති වැය ශීර්ෂ | රු. | ශ |
|---|---|---|
| ඒ.—සාමාන්‍ය :— | | |
| 1. නිළධාරීන්ගේ වැටුප්— | | |
| (ඒ) ලේකම් ... ... ... | 400 | 0 |
| (බී) ලිපිකරු මණ්ඩලය ... ... | 1,030 | 0 |
| (සී) ආදායම් පරීක්ෂක ... ... | 335 | 0 |
| (ඩී) කා.කා. සහායක ... ... | 310 | 0 |
| (ජේ) විවාහක දීමනා ... ... | 55 | 0 |
| 2. සංස්ථා වියදම්— | | |
| (අෆ්) ලිපිද්‍රව්‍ය ... ... ... | 699 | 0 |
| සී.—නගර සභා ඉඩම් සහ ගොඩනැගිලි :— | | |
| (i) වේතන ... ... ... | 197 | 0 |
| (ii) විවාහක දීමනා ... ... ... | 15 | 0 |
| ඩී.—මහජන සෞඛ්‍යය :— | | |
| 2. කැලි කශළ ශෝධනය— | | |
| (ඒ) දෛනික වැටුප් ... ... | 1,040 | 0 |
| (ජී) විවාහක දීමනා ... ... | 65 | 0 |
| 3. වැසිකිළි පවිත්‍ර කිරීම— | | |
| (ඒ) දෛනික වැටුප් ... ... | 1,050 | 0 |
| (ජේ) විවාහක දීමනා ... ... | 65 | 0 |
| එකතුව ... | 5,261 | 0 |

1969 දෙසැම්බර් මස 27 වෙනි දින මාසික රැස්වීමේ අංක 7 (i) දරණ යෝජනාවෙන් පිළිගෙන සම්මත කරන ලදී.

එච්. ඇල්. මරික්කාර්,
පැල්මඩුල්ල සුළු නගර සභාවේ සභාපති.

1969 දෙසැම්බර් මස 27 වෙනි දින,
පැල්මඩුල්ල සුළු නගර සභා කාර්‍යාලයේදී.

අනුමත කරන ලදී.

ඩොනල්ඩ් අබේසිංහ,
රත්නපුර පළාත් පාලන කොමසාරිස්.

1970 ජනවාරි මස 13 දින,
රත්නපුර පළාත් පාලන අමාත්‍යාංශ කාර්‍යාලයේදීය.

1–564—70.1.29 දින අංක 14,891 දරන ගැසට් පත්‍රය

## දඹුල්ල සුළු නගර සභාව

**1969 වර්ෂයේ අංක 3 දරණ පරිපූරක අය-වැය ලේඛනය**

| වැය ශීර්ෂයෝ | යෝජිත වැය රු. ශ. |
|---|---|
| ඞී : මහජන සෞඛ්‍යය : | |
| 5 : ජල සම්පාදනය : | |
| (සී) : නඩත්තු කිරීම් : | 750 0 |
| | **750 0** |

1969 දෙසැම්බර් මස 27 වැනි දින පවත්වනු ලැබූ, දඹුල්ල සුළු නගර සභාවේ, දෙසැම්බර් මාසයේ මාසික සභා රැස්වීමේදී යෝජනා අංක 5 දරණ සභා සම්මුතියෙන් පළාත් පාලන සහකාර කොමසාරිස් තුමාගේ සංශෝධනයන්ට යටත්ව, මෙම පරිපූරක අය වැය ලේඛනය පිළිගැනීමට සභාව විසින් තීරණය කරන ලදී.

හෙ. වී. ප්‍රේමතිලක,
සභාපති,
සුළු නගර සභාව, දඹුල්ල.

1969 දෙසැම්බර් මස 29 වැනි දින,
දඹුල්ල සුළු නගර සභා කාර්යාලයේදීය.

සංශෝධිත පරිදි අනුමත කරමි.

ඞී. අළුවිහාරේ,
ස. ප. පා. කො.

1970.1.16, මාතලේ.

1–552—70.1.29 දින අංක 14,891 දරන ගැසට් පත්‍රය

---

# විවිධ දැන්වීම්

යොමු අංකය; එම්ඊ/ඩීසී/පීඇස් 19/68

### කොළඹ 5, තිඹිරිගස්යායේ අංක 176 දරන ස්ථානයේ පිහිටි පුද්ගලික වීථිය තැනීම

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 268 වන පරිච්ඡේදය, 26 වැනි ඡේදය යටතේ පිළියෙල කරන ලද ප්‍රාරම්භක වියදම කොටස් කිරීම**

කොළඹ, 5 තිඹිරිගස්යායේ අංක 176 දරණ ස්ථානයේ පිහිටි පුද්ගලික වීථියේ පහත සඳහන් වැඩ කිරීම සම්බන්ධයෙන් ගෘහ හා නගර සංවර්ධන ආඥාපනතේ ලංකාවේ ව්‍යවස්ථාපිත අනපණත්වල 268 වන පරිච්ඡේදය, 26 වන ඡේදය යටතේ, කොළඹ නාගරික කොමසාරිස්වරයා විසින් පිළියෙල කරන ලද ප්‍රාරම්භක වියදම කොටස් කිර්ම මෙහි පහත දක්වේ.

(අ) දෙපැත්තේ අයිනට අඩි 5 ක් පළලට තණ පිඩලි සහිත අර්ධ කවාකාර කොන්ක්‍රීට් කාණු යෙදූ, අහල් 4 ක් ඝනට ගල් සහ තාර දමූ, විදුලි පහන් සහිත වූ අඩි 20 ක් පළලැති රථවාහන මාර්ගයක් සහ ප්‍රධාන වැසිවතුර කාණුවට සම්බන්ධ කරන ලද, පොළොව යටින් තැනූ වැසි වතුර කාණුවක්.

මෙම වියදම් කොටස් කර තිබෙන්නේ දැනට ව්‍යවහාර කම්කරු ගාස්තු සහ ද්‍රව්‍ය මිල අනුව, පිළියෙල කරන ලද ඇස්තමේන්තු උඩ හෙයින්, නියම වශයෙන් වැඩකරන කාලයේදී ද්‍රව්‍ය මිල අඩු වැඩිවීමේ හේතුවෙන් මෙම වියදම කොටස් කිරීම ද වෙනස් විය හැකිය.

| තක්සේරු අංකය | වීදියේ නම | අයිතිකරුගේ නම සහ ලිපිනය | තැනීමේ වියදම රු. ශ. | වියදම කොටස් කිරීම රු. ශ. |
|---|---|---|---|---|
| 176/1 | තිඹිරිගස්යාය පාර | ජී. සී. වොලස් මිය., 176/5, තිඹිරිගස්යාය පාර | 5,520 0 | 5,520 0 |
| 176/3 | තිඹිරිගස්යාය පාර | දෙස්තර ඩී. ඒ. තෙවරප්පෙරුම මයා., 29, ගෆූර් ගොඩනැගිල්ල, කොළඹ 1 | 3,480 0 | 3,480 0 |
| 176/5 | තිඹිරිගස්යාය පාර | ජී. සී. වොලස් මිය., 176/5, තිඹිරිගස්යාය පාර | 10,860 0 | 10,860 0 |
| 176/22 | තිඹිරිගස්යාය පාර | ඩබ්. ඒ. ජයවර්ධන මයා., 176/22, තිඹිරිගස්යාය පාර | 750 0 | 750 0 |
| 176/25 | තිඹිරිගස්යාය පාර | ක්ලෙරන්ස් අමරසිංහ මයා., 20, ස්කෙල්ටන් පාර, කොළඹ 5 | 2,430 0 | 2,430 0 |
| 176/28 | තිඹිරිගස්යාය පාර | ඩඩ්ලි ප්‍රනාන්දු මයා., 176/28, තිඹිරිගස්යාය පාර | 3,780 0 | 3,780 0 |
| 176/30 | තිඹිරිගස්යාය පාර | දෙස්තර, ආර්. එස්. රාමක්‍රිෂ්න මයා., 176/30, තිඹිරිගස්යාය පාර | 840 0 | 840 0 |
| 176/34 | තිඹිරිගස්යාය පාර | එම්. සෙනෙවිරත්න මයා., 176/34, තිඹිරිගස්යාය පාර | 4,680 0 | 4,680 0 |
| 176/36 | තිඹිරිගස්යාය පාර | එල්. එන්. පීරිස් මයා., 176/36, තිඹිරිගස්යාය පාර | 4,020 0 | 4,020 0 |
| 176/38 | තිඹිරිගස්යාය පාර | සී. එස්. විජේරත්න මයා., 176/38, තිඹිරිගස්යාය පාර | 480 0 | 480 0 |
| 176/40 | තිඹිරිගස්යාය පාර | එම්. එල්. ද සිල්වා මයා., 176/40, තිඹිරිගස්යාය පාර | 1,380 0 | 1,380 0 |
| 176/42 | තිඹිරිගස්යාය පාර | ඒ. ජී. ද. සිල්වා මයා., 176/42, තිඹිරිගස්යාය පාර | 1,980 0 | 1,980 0 |
| 176/44 | තිඹිරිගස්යාය පාර | එස්. පී. විජේරත්න මයා., 176/44, තිඹිරිගස්යාය පාර | 2,400 0 | 2,400 0 |
| | | | 42,600 0 | 42,600 0 |

ආර්. කනගරායර්,
වැඩ බලන නාගරික කොමසාරිස්.

නගර ශාලාව,
කොළඹ 7,
1970.1.12.

1–566—70.1.29 දින අංක 14,891 දරන ගැසට් පත්‍රය

---

## මහනුවර දිස්ත්‍රික්කයේ හාරිස්පත්තු පල්ලේගම්පහ උතුරු ගම්සභාව

**1952 අංක 6 දරණ පළාත් පාලන ආයතන පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා පනත (261 වැනි අධිකාරය)**

පළාත් පාලන ආයතන "පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා" පනතේ 3 වැනි වගන්තිය යටතේ මහනුවර දිස්ත්‍රික්කයේ හාරිස්පත්තු පල්ලේගම්පහ උතුරු ගම්සභාව විසින් සම්මත කරගෙන තිබෙන පහත සඳහන් යෝජනාව එකී වගන්තිය ප්‍රකාර මෙයින් පළ කර සිටිනු ලැබේ.

### යෝජනාව

පළාත් පාලන ඇමතිතුමා විසින් සම්මත කරගනු ලැබ 1953 අප්‍රේල් මස 10 වැනි දින අංක 10,517 දරණ ගැසට් පත්‍රයේ පළ කරනු ලද්දාවූ ද, උත්තර මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් අනුමතකරන ලද බව 1953 අගෝස්තු මස 7 වැනි දින අංක 10,560 දරන ගැසට් පත්‍රයේ පළ වූ නිවේදනයෙන් ප්‍රකාශයට පත්කරන ලද්දාවූ ද, පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල අංක 1 සිට 37 දක්වා වූ කාණ්ඩද, උත්තර මන්ත්‍රීමණ්ඩලයේ හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් අනුමත කරනු ලැබ 1965 ජනවාරි මස 8 වැනි දින අංක 14,287 දරන ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පමුණුවනු ලද්දාවූ ද එකී අතුරු ව්‍යවස්ථාමාලාවේ අංක 38 දරන කාණ්ඩයද, වර්ෂ 1966 ක්වූ ජූනි මස 8 වෙනි දින අංක 14,703 දරන ගැසට් පත්‍රයේ පළවූ නිවේදනයෙන් ප්‍රකාශ කරන ලද්දාවූ ද, එකී අතුරු ව්‍යවස්ථා මාලාවේ 39, 40 සහ 41 වෙනි කාණ්ඩද, මෙම යෝජනාව ගැසට් පත්‍රයේ පළවූ දින සිට ක්‍රියාත්මක වන අන්දමින් සම්මත කරගැනීමට මහනුවර දිස්ත්‍රික්කයේ හාරිස්පත්තු පල්ලේගම්පහ උතුරු ගම්සභාව විසින් පළාත් පාලන ආයතන පොදු "පොදු අතුරු ව්‍යවස්ථා පනතේ (261 වැනි අධිකාරය) 3 වැනි වගන්තියේ" 1 වැනි උප වගන්තිය යටතේ මෙයින් යෝජනා කර සිටිනු ලැබේ.

ඒ. ඇම්. මුදලිහාමි,
හාරිස්පත්තු පල්ලේගම්පහ
උතුරු ගම්සභාවේ සභාපති.

වර්ෂ 1969 ක් වූ සැප්තැම්බර් මස 22 වෙනි දින,
හාරිස්පත්තු පල්ලෙගම්පහ උතුරු ගම්සභා කාර්යාලය,
අංකුඹුර.

1–558—70.1.29 දින අංක 14,891 දරන ගැසට් පත්‍රය

## කල්පේ කෝරලේ ගම්සභාව—අනුරාධපුර දිස්ත්‍රික්කය

### මස් පිණිස සතුන් මැරීම පිළිබඳ ආඥපනත

මෙහි පහත උපලේඛනයෙහි නම් සඳහන් ස්ථානයෙහි 1970 වර්ෂයට මස් පිණිස සතුන් මරා විකිණීම සඳහා බලපත්‍ර ඉල්ලා අයදුම් පත් මා වෙත එවා තිබෙන බව මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥපනතේ 272 පරිච්ඡෙදයේ 7 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

එකී බලපත්‍ර නිකුත් කිරීම ගැන කල්පේ කෝරලේ ගම්සභාව සීමාව තුල පදිංචි යම් කෙනෙකු විරුද්ධ වන්නේ නම් ඔහු හෝ ඇ එසේ විරුද්ධ වන්නේ කුමන හේතු නිසාද යන වග ලියවිල්ලක් පිටපත් දෙකක් සහිතව මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පලවූ දින සිට දින 14 ක් ඇතුලත මා වෙත දන්වා එවිය යුතු බව මෙයින් දන්වා සිටිමි.

#### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | වෙළඳාම | ස්ථානය |
|---|---|---|
| ඒ. ඇම්. සාලි, නවාස් ස්ටෝර්ස්, හොරොව්පොතාන ... | ... එළහරක් මස් වෙළඳාම ... | ... හොරොව්පොතාන |

කේ. පුංචි බණ්ඩා,
කල්පේ කෝරලේ ගම්සභාවේ සභාපති තැන.

1970.1.17 දින.

1-547—70.1.29 දින අංක 14,891 දරන ගැසට් පත්‍රය

---

## කළුතර දිස්ත්‍රික්කයේ කළුතර බද්ද ගම්සභාව

### මස් පිණිස සතුන් මැරීම පිළිබඳ ආඥපනත

මෙහි පහත සඳහන් උපලේඛනයේ සඳහන් අය එහි සඳහන් ස්ථානයේ 1970 වර්ෂයට සතුන් මරා මස් විකිණීම පිණිස බලපත්‍ර ඉල්ලා අයදුම් පතක් මා වෙත ඉදිරිපත් කර තිබෙන බව මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥපනතේ 272 වෙනි පරිච්ඡෙදයේ 7 (2) වෙනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

එකී බලපත්‍ර නිකුත් කිරීම ගැන කළුතර බද්ද ගම්සභා ප්‍රදේශයේ සීමා තුල පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම් ඔහු හෝ ඇය විරුද්ධ වන්නේ කුමන හේතුන් නිසාද යනවග සඳහන් ලියවිල්ලක් පිටපත් දෙකක් සහිතව මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළ වූ දින සිට දින 14 ක් ඇතුලත මා වෙත එවිය යුතු බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

#### උපලේඛනය

| අයදුම්කරුගේ නම සහ ලිපිනය | වෙළඳාම | ස්ථානය |
|---|---|---|
| බී. ඇම්. ඇස්. හුසේන්, 38, ගුඩ්ෂෙඩ් පාර, කළුතර දකුණ ... | ... මස් කඩය ... | ... කහටගහවත්ත-කලමුල්ල, කළුතර |

ඩී. ලුවිස් සිල්වා,
කළුතර බද්ද ගම්සභාව.

ගම්සභා කායසීලය,
නාගොඩ-බෝම්බුවල,
70.1.13 දින.

1-553—70.1.29 දින අංක 14,891 දරන ගැසට් පත්‍රය

---

## කොළඹ දිස්ත්‍රික්කයේ කටාන ගම් සභාව

### ගෝඝාතක ආඥපනත

මෙහි පහත උපලේඛනයේ නම් සඳහන් අයවලුන් විසින් එහි සඳහන් ස්ථානයන්හි මස් වෙළඳාම් කිරීමෙන් ගෝඝාතක ව්‍යාපාරය පවත්වා ගෙන යාම සඳහා 1970 වර්ෂයට බලපත්‍ර ඉල්වා අයදුම්පත් මා වෙත ඉදිරිපත් කර තිබෙන බව ගෝඝාතක ආඥපනතේ (272 වැනි අධිකාරය) 7(2) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

එකී බලපත්‍ර නිකුත් කිරීම ගැන කටාන ගම්සභා ප්‍රදේශ සීමාව තුළ පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම්, ඔහු හෝ ඇය එසේ විරුද්ධ වන්නේ කුමන හේතුන් නිසාද යන වග සඳහන් ලියවිල්ලක් පිටපත් දෙකකින් යුක්තව මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට දින 14ක් ඇතුළත මා වෙත එවිය යුතු බව මෙයින් දැනුම් දෙමි.

ඇම්. ඇස්. අයිවන් ද සිල්වා,
සභාපති,
කටාන ගම්සභාව.

වර්ෂ 1970ක්වූ ජනවාරි මස 10 වැනිදින දීය,
කටාන ගම්සභා කායසීලය,
කටාන.

#### උපලේඛනය

| | අයදුම්කරුගේ නම සහ ලිපිනය | ස්ථානය | ව්‍යාපාරයේ නම |
|---|---|---|---|
| 1. | ඒ.ආර්.එම්. සුලෙයිමාන්, ෂබීඩියා වත්ත, දෙමන්හන්දිය | ගම්සභාව සතු කඩපිල, දෙමන්හන්දිය ... | හරක්මස් සහ එළුමස් විකිණීම |
| 2. | එම්. ඒ. ජලාල්දීන්, අංක, 15 ජයරත්න පාර, මීගමුව. ... | ගම්සභාව සතු කඩපිල, දළුපොත ... | හරක්මස් සහ එළුමස් විකිණීම |
| 3. | එල්. ජේ. වී. පීරිස්, හලාවත පාර, මානාවේරිය, කොච්චිකඩේ | ගම්සභාව සතු කඩපිල, දළුවකොටුව ... | හරක්මස්, එළුමස් සහ ඌරුමස් විකිණීම |
| 4. | කේ. බාර්බරා මිරාන්ඩු ... | ගම්සභාව සතු කඩපිල, ... | හරක්මස්, එළුමස් සහ ඌරුමස් විකිණීම |
| 5. | ඩබ්. ප්‍රැන්සිස් ප්‍රනාන්දු, මුරුතැන, කොච්චිකඩේ ... | ගම්සභාව සතු කඩපිල, උඩංගාව ... | හරක්මස්, එළුමස් සහ ඌරුමස් විකිණීම |
| 6. | ඒ. එව්ජින් ප්‍රනාන්දු, මුරුතැන, කොච්චිකඩේ ... | ගම්සභාව සතු කඩපිල, බම්බුකුළිය ... | හරක්මස්, එළුමස් සහ ඌරුමස් විකිණීම |
| 7. | ටී. ස්ටීවන් පෙරේරා, කඳවල, කටාන ... | ගම්සභාව සතු කඩපිල, කඳවල ... | හරක්මස්, එළුමස් සහ ඌරුමස් විකිණීම |
| 8. | ටී. ස්ටීවන් පෙරේරා, කඳවල, කටාන ... | ගම්හභාව සතු කඩපිල නො. 1 ඇත්ගාල | හරක්මස්, එළුමස් සහ ඌරුමස් විකිණීම |
| 9. | ටී. ස්ටීවන් පෙරේරා, කඳවල, කටාන ... | ගම්සභාව සතු කඩපිල නො. 2 ඇත්ගාල | හරක්මස්, ළුමස් සහ ඌරුමස් විකිණීම |
| 10. | ඒ. එච්. එම්. පාරුක්, 59 ගිරිඋල්ල රෝඩ්, මීගමුව ... | ගම්සභාව සතු කඩපිල, කටුවපිටිය ... | හරක්මස්, සහ එළුමස් විකිණීම |
| 11. | ජේ. බෙනඩික් පෙරේරා, 65, මහහුණුපිටිය, මීගමුව | ගම්සභාව සතු කඩ පිල, මහහුණුපිටිය ... | ඌරුමස් විකිණීම |
| 12. | ඩබ්. ඩී. අගුස්තීනු අප්පුහාමි, කොන්දගම්මුල්ල, කටාන | ගම්සභාව සතු කඩපිල, කිඹුලාපිටිය ... | හරක්මස්, එළුමස් සහ ඌරුමස් විකිණීම |
| 13. | ජේ. ඒ. ඇන්ටන් අප්පුහාමි, 197, කොච්චිකඩේ ... | ගම්සභාව සතු කඩපිල නො. 2 කටාන ... | හරක්මස්, එළුමස් සහ ඌරුමස් විකිණීම |
| 14. | එම්. එස්. එම්. රසීක්, 73/38, මොස්ක් රොඩ්, මීගමුව ... | ගම්සභාව සතු කඩපිල, හුණුපිටිය ... | හරක්මස් සහ එළුමස් විකිණීම |
| 15. | එම්. ජේ. එම්. ෂාපියම්, 374/11 හලාවත පාර, පෙරියමුල්ල, මීගමුව | ගම්සභාව සතු කඩපිල, නො. 1 කට්ටුව ... | ඌරුමස් සහ එළුමස් විකිණීම |

1-537/1—70.1.29 දින අංක 14,891 දරන ගැසට් පත්‍රය

## කොළඹ දිස්ත්‍රික්කයේ කටාන ගම් සභාව

### ගෝඝාතක ආඥපනත

ගෝඝාතන ආඥපනතේ (272 වැනි අධිකාරය) 17 (1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලයේ ප්‍රකාර නියමිත බලධරයා වූ කටාන ගම්සභාවේ සභාපති ඇම්. ඇස්. අයිවන් ද සිල්වා වන මම 1970 වර්ෂයේ පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් දිනයන්හිදී කටාන ගම්සභා සීමාව තුළ මස් පිණිස සතුන් මැරීමෙන් ගෝඝාතන ව්‍යාපාරය පවත්වා ගෙන යාම මෙයින් තහනම් කරමි.

ඇම්. ඇස්. අයිවන් ද සිල්වා,
සභාපති,
කටාන ගම්සභාව.

1970 ජනවාරි මස 10 වෙනි දින,
කටාන ගම්සභා කාර්යාලය,
කටාන.

### උප ලේඛනය

| | | |
|---|---|---|
| ජනවාරි | 22 | පසලොස්වක පෝය දිනය |
| පෙබරවාරි | 4 | නිදහස් අනුස්මරන දිනය |
| පෙබරවාරි | 21 | පසලොස්වක පෝය දිනය |
| මාර්තු | 22 | පසලොස්වක පෝය දිනය |
| මාර්තු | 27 | මහ සිකුරාද |
| අප්‍රේල් | 21 | පසලොස්වක පෝය දිනය |
| මැයි | 20 | පසලොස්වක පෝය දිනය |
| මැයි | 21 | පසලොස්වක පෝය දිනට පසුදින |
| ජූනි | 19 | පසලොස්වක පෝය දිනය |
| ජූලි | 18 | පසලොස්වක පෝය දිනය |
| අගෝස්තු | 16 | පසලොස්වක පෝය දිනය |
| සැප්තැම්බර් | 15 | පසලොස්වක පෝය දිනය |
| ඔක්තෝබර් | 4 | ලෝක සත්ව දිනය |
| ඔක්තෝබර් | 14 | පසලොස්වක පෝය දිනය |
| නොවැම්බර් | 13 | පසලොස්වක පෝය දිනය |
| දෙසැම්බර් | 12 | පසලොස්වක පෝය දිනය |

1–537/2—70.1.29 දින අංක 14,891 දරන ගැසට් පත්‍රය

---

## කොස්ලන්ද ගම් සභාව—බදුල්ල දිස්ත්‍රික්කය

### ගෝඝාතක ආඥපනත

මෙහි පහත උපලේඛනයේ නම් සඳහන් අය එහි සඳහන්කර ඇති ස්ථානයේ මස් පිණිස සතුන් මරා විකිණීම සඳහා 1970 වර්ෂයට බලපත්‍රයක් ඉල්ලුම් කර සිටින බවත්, ඒ අනුව බලපත්‍රයක් නිකුත් කිරීම ගැන කොස්ලන්ද ගම්සභා ප්‍රදේශය තුල පදිංචි යම් අයෙක් හෝ සංවිධානයක් විරුද්ධවන්නේ නම්, එසේ විරුද්ධවීමට හේතු සඳහන්කර පිටපත් දෙකකින් යුත් ලියවිල්ලක්, මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පලවූ දින සිට දින 14ක් ඇතුලත මා වෙත දන්වා එවිය යුතුබව ගෝඝාතක ආඥපනතේ (272 වැනි පරිච්ඡේදයේ) 7(2) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම්දෙමි.

### උපලේඛනය

| අයදුම්කරුගේ නම හා ලිපිනය | වෙළඳම | ස්ථානය |
|---|---|---|
| ඇම්. ජේසුදසන්, 30/75, වේළුවනපාර, දෙමටගොඩ, කොළඹ 9 | එලහරක් මස් සහ එළුමස් ... | කොස්ලන්ද-හපුතල පාරේ අංක 97 දරණ ස්ථානය |

ගම්සභා කායර්‍යාලයය,
කොස්ලන්ද, 1970 ජනවාරි 16 දින

ඩබ්ලිව්. ඒ. වීරසිංහ,
කොස්ලන්ද ගම්සභාවේ සභාපති

1–527—70.1.29 දින අංක 14,891 දරන ගැසට් පත්‍රය

---

## යටියන්තොට සුළු නගර සභාව

### ගෝඝාතක ආඥපනත (271 වැනි අධිකාරය)

ගෝ ඝාතක ආඥ පනතේ (272 වැනි අධිකාරය) 17(1) දරණ වගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලය ප්‍රකාර නිසි බලධාරයවූද, යටියන්තොට සුළු නගර සභාවේ සභාපතිතැනවූ ද, කේ. වින්සන්ට් පෙරේරා වන මම, 1970 වර්ෂය තුළදී පහත සඳහන් උපලේඛනයේ දැක්වෙන දිනවල කෑගල්ල දිස්ත්‍රික්කයේ යටියන්තොට සුළු නගර සභා සීමා ඇතුලත මස් පිණිස සතුන් මැරීම හෝ මස්විකිණීම පිණිස ප්‍රදර්ශණය කිරීම හෝ සම්පූර්ණයෙන්ම මෙයින් තහනම් කරමි.

කේ. වින්සන්ට් පෙරේරා.
(නිසි බලධරයා)
සභාපති.
යටියන්තොට සුළු නගර සභාව.

1970 ජනවාරි මස 18 දින,
යටියන්තොව,
සුළු නගර සභා කාර්යාලයේදීය.

### උප ලේඛනය

| | | | |
|---|---|---|---|
| 1970 | ජනවාරි | 7 වැනි බදාද | (අමාවක) |
| 1970 | ජනවාරි | 15 වැනි බ්‍රහස්පතින්ද | (පුර අටවක) |
| 1970 | ජනවාරි | 22 වැනි බ්‍රහස්පතින්ද | (පසළොස්වක) |
| 1970 | ජනවාරි | 30 වැනි සිකුරාද | (අව අටවක) |
| 1970 | පෙබරවාරි | 6 වැනි සිකුරාද | (අමාවක) |
| 1970 | පෙබරවාරි | 14 වැනි සෙනසුරාද | (පුර අටවක) |
| 1970 | පෙබරවාරි | 21 වැනි සෙනසුරාද | (පසළොස්වක) |
| 1970 | පෙබරවාරි | 28 වැනි සෙනසුරාද | (අව අටවක) |
| 1970 | මාර්තු | 7 වැනි සෙනසුරාද | (අමාවක) |
| 1970 | මාර්තු | 15 වැනි ඉරිද | (පුර අටවක) |
| 1970 | මාර්තු | 22 වැනි ඉරිද | (පසළොස්වක) |
| 1970 | මාර්තු | 30 වැනි සඳුද | (අව අටවක) |
| 1970 | අප්‍රේල් | 6 වැනි සඳුද | (අමාවක) |
| 1970 | අප්‍රේල් | 14 වැනි අඟහරුවාද | (පුර අටවක) |
| 1970 | අෙශල් | 21 වැනි අඟහරුවාද | (පසළොස්වක) |
| 1970 | අප්‍රේල් | 28 වැනි අඟහරුවාද | (අව අටවක) |
| 1970 | මැයි | 5 වැනි අඟහරුවාද | (අමාවක) |
| 1970 | මැයි | 13 වැනි බදාද | (පුර අටවක) |
| 1970 | මැයි | 20 වැනි බදාද | (පසළොස්වක) |
| 1970 | මැයි | 28 වැනි බ්‍රහස්පතින්ද | (අව අටවක) |
| 1970 | ජූනි | 4 වැනි බ්‍රහස්පතින්ද | (අමාවක) |
| 1970 | ජූනි | 12 වැනි සිකුරාද | (පුර අටවක) |
| 1970 | ජූනි | 19 වැනි සිකුරාද | (පසළොස්වක) |
| 1970 | ජූනි | 26 වැනි සිකුරාද | (අව අටවක) |
| 1970 | ජූලි | 3 වැනි සිකුරාද | (අමාවක) |
| 1970 | ජූලි | 11 වැනි සෙනසුරාද | (පුර අටවක) |
| 1970 | ජූලි | 18 වැනි සෙනසුරාද | (පසළොස්වක) |
| 1970 | ජූලි | 25 වැනි සෙනසුරාද | (අව අටවක) |
| 1970 | අගෝස්තු | 1 වැනි සෙනසුරාද | (අමාවක) |
| 1970 | අගෝස්තු | 9 වැනි ඉරිද | (පුර අටවක) |
| 1970 | අගෝස්තු | 16 වැනි ඉරිද | (පසළොස්වක) |
| 1970 | අගෝස්තු | 23 වැනි ඉරිද | (අව අටවක) |
| 1970 | අගෝස්තු | 31 වැනි සඳුද | (අමාවක) |
| 1970 | සැප්තැම්බර් | 8 වැනි අඟහරුවාද | (පුර අටවක) |
| 1970 | සැප්තැම්බර් | 15 වැනි අඟහරුවාද | (පසළොස්වක) |
| 1970 | සැප්තැම්බර් | 22 වැනි අඟහරුවාද | (අව අටවක) |
| 1970 | සැප්තැම්බර් | 29 වැනි අඟහරුවාද | (අමාවක) |
| 1970 | ඔක්තෝබර් | 7 වැනි බදාද | (පුර අටවක) |
| 1970 | ඔක්තෝබර් | 14 වැනි බදාද | (පසළොස්වක) |
| 1970 | ඔක්තෝබර් | 22 වැනි බ්‍රහස්පතින්ද | (අව අටවක) |
| 1970 | ඔක්තෝබර් | 29 වැනි බ්‍රහස්පතින්ද | (අමාවක) |
| 1970 | නොවැම්බර් | 6 වැනි සිකුරාද | (පුර අටවක) |
| 1970 | නොවැම්බර් | 13 වැනි සිකුරාද | (පසළොස්වක) |
| 1970 | නොවැම්බර් | 21 වැනි සෙනසුරාද | (අව අටවක) |
| 1970 | නොවැම්බර් | 28 වැනි සෙනසුරාද | (අමාවක) |
| 1970 | දෙසැම්බර් | 5 වැනි සෙනසුරාද | (පුර අටවක) |
| 1970 | දෙසැම්බර් | 12 වැනි සෙනසුරාද | (පසළොස්වක) |
| 1970 | දෙසැම්බර් | 20 වැනි ඉරිද | (අව අටවක) |
| 1970 | දෙසැම්බර් | 27 වැනි ඉරිද | (අමාවක) |

1–533—70.1.29 දින අංක 14,891 දරන ගැසට් පත්‍රය

## නාවලපිටිය පළාත් ආණ්ඩු සභාව

### 1970 වර්ෂය සඳහා වරිපනම් පොත්

නාවලපිටිය පළාත් ආණ්ඩු සභාවේ වරිපනම් පොත් 1970 වර්ෂය සඳහා සම්පාදනයවී ඇති අතර ඒවා නියමිත කාර්යාල වේලාවන් හිදී අයබදු ගෙවන්නන් හට පරීක්ෂා කර බැලීම පිණිස මෙම කාර්යාලයෙහි විවෘත තබා ඇති බව, 255 වෙනි අධිකාරය යටතේ වූ පළාත් ආණ්ඩු සභා ආඥාපනතේ 166 දරණ වගන්තිය හා කියවෙන පරිදි 252 වෙනි අධිකාරය යටතේ වූ මහ නගර සභා ආඥාපනතේ (235) (1) වෙනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙනු ලැබේ.

එච්. එම්. එල්. බදුර්දීන්,
නාවලපිටිය පළාත් ආණ්ඩු සභාවේ සභාපති.

පළාත් ආණ්ඩු සභා කාර්යාලය,
නාවලපිටිය.

1–532—70.1.29 දින අංක 14,891 දරන ගැසට් පත්‍රය

---

## බලන්ගොඩ නගර සභාව

### ජලභීතිකා රෝගය

බලන්ගොඩ නගර සීමාව තුල ජල භීතිකා රෝග උවදුරු පවතින බැවින් එම නගර සීමාව තුල පිහිටි පෞද්ගලික ගොඩනැගිල්ලක, ගෙමිදුලක හෝ ගෙවත්තක නොවන්නාවූ අන්‍ය ප්‍රසිද්ධ ස්ථානයක හෝ පාරක හමුවන, දඩාවතේ යන නැතහොත් බැඳ නොතබන ලද්දාවූ හෝ දක්කා ගෙන නොයනු ලබන්නාවූ කිසියම් සුනඛයෙකු (බල්ලෙකු හෝ බැල්ලියකු) මා විසින් බලය පවරනු ලබන අයෙකු විසින් එවේලෙහිම විනාශ කරනු ලබන බව (ලංකාවේ ව්‍යවස්ථාපිත ප්‍රඥප්ති සංග්‍රහයේ 476 වෙනි පරිච්ඡේදයේ වන) ජල භීතිකා ආඥාපනතේ 11 වෙනි වගන්තිය ප්‍රකාර මෙයින් ප්‍රකාශ කරනු ලැබේ.

මෙම ප්‍රකාශය 1970 දෙසැම්බර් මස 31 වෙනි දින දක්වා වලංගුවේ.

ඇම්. ඇල්. ඇම්. අබුසාලි,
සභාපති,
නගර සභාව, බලන්ගොඩ.

1970.1.18 වෙනි දින,
බලන්ගොඩ, නගර සභා කාර්යාලයේ දීය.

1–529—70.1.29 දින අංක 14,891 දරන ගැසට් පත්‍රය

---

## බලපිටිය උප නගර සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාව

මෙහි පහත උපලේඛනයෙහි සඳහන් අය විසින් මස් විකිණීමට 1970 වර්ෂයට බලපත්‍රයක් ඉල්ලුම් කර තිබෙන බවත්, මෙම බලපත්‍ර නිකුත් කිරීමට විරුද්ධව බලපිටිය සුළු නගර සභා සීමාව ඇතුලත පදිංචි ඕනෑම කෙනෙකුට තමා ඒ සඳහා විරුද්ධවන්නේ අසවල් කරුණ සඳහායයි දැක්වෙන පිටපතකින් යුත් ලියවිල්ලක් මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පලවන දින සිට දින 14 ක් ඇතුලත මා වෙත ලියා එවීමට බලය තිබෙන බවත්, මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතවූ 272 වන අධිකාරයේ අංක 7 (2) දරණ වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

පී. වයිමන් ද සිල්වා,
සභාපති,
බලපිටිය සුළු නගර සභාව.

1970 ජනවාරි මස 17 වන දින,
බලපිටිය සුළු නගර සභා කාර්යාලය.

### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | ස්ථානය සහ වෙළඳාම |
|---|---|
| එම්. එච් එම්. සම්සම්, වැලිතර, බලපිටිය. | නො. 111, කොළඹ පාර, බලපිටිය —හරක් මස් කඩය |

1–535—70.1.29 දින අංක 14,891 දරන ගැසට් පත්‍රය

---

## වැල්ලව ගම්සභා ප්‍රදේශය—කුරුණෑගල දිස්ත්‍රික්කය

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ (272 අධිකාරය) 17 ඡේදය යටතේ නියෝගය

මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ (272 අධිකාරය) 17 (1) ඡේදය යටතේ නිසි බලධාරියා වූද, වැල්ලව ගම්සභාවේ සභාපති තැන වූද, ඩී. පී. දාවිත් වන මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර 1970 වර්ෂය තුල මෙම ගම්සභා ප්‍රදේශය ඇතුලත මස් පිණිස සතුන් මැරීම හා මස් වෙළඳාම පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් දිනවලදී මෙයින් සම්පූර්ණයෙන්ම තහනම් කරමි.

### උපලේඛනය

| | | |
|---|---|---|
| 1970 ජනවාරි 22 | ... | දුරුතු පසළොස්වක පෝය |
| 1970 පෙබරවාරි 21 | ... | නවම් පසළොස්වක පෝය |
| 1970 මාර්තු 22 | ... | මැදින් පසළොස්වක පෝය |
| 1970 අප්‍රේල් 21 | ... | බක් පසළොස්වක පෝය |
| 1970 මැයි 20 | ... | වෙසක් පසළොස්වක පෝය |
| 1970 මැයි 21 | ... | පෝ දිනට පසු දින |
| 1970 ජූනි 19 | ... | පොසොන් පසළොස්වක පෝය |
| 1970 ජූලි 18 | ... | ඇසළ පසළොස්වක පෝය |
| 1970 අගෝස්තු 16 | ... | නිකිණි පසළොස්වක පෝය |
| 1970 සැප්තැම්බර් 15 | ... | බිනර පසළොස්වක පෝය |
| 1970 ඔක්තෝබර් 4 | ... | ලෝක සත්ව දිනය |
| 1970 ඔක්තෝබර් 14 | ... | වප් පසළොස්වක පෝය |
| 1970 නොවැම්බර් 13 | ... | ඉල් පසළොස්වක පෝය |
| 1970 දෙසැම්බර් 12 | ... | උඳුවප් පසළොස්වක පෝය |

ඩී. පී. දාවිත්,
වැල්ලව ගම්සභාවේ සභාපති.

1970 ජනවාරි 17 දින,
ගම්සභා කාර්යාලය,
මරළුවාව, කුරුණෑගල.

1–536—70.1.29 දින අංක 14,891 දරන ගැසට් පත්‍රය

---

## 1952 අංක 6 දරණ පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනත

261 වැනි අධිකාරයේ වන පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වැනි වගන්තිය යටතේ ගාල්ල දිස්ත්‍රික්කයේ පෝද්දිවල-නියාගම ගම්සභාව විසින් සම්මත කරගෙන තිබෙන පහත සඳහන් යෝජනාව, එකී වගන්තියේ ප්‍රකාර මෙයින් පළ කර සිටිනු ලැබේ.

### යෝජනාව

පළාත් පාලන ඇමතිවරයා විසින් සම්පාදනය කරනු ලැබ, 1966 ජූලි මස 8 වැනි දින අංක 14,703 දරණ ගැසට් පත්‍රයේ පළකරන ලද්දාවූද, උත්තර මන්ත්‍රී මණ්ඩලයේ හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් අනුමත කරන ලද බව 1969 ජනවාරි මස 3 වැනි දින අංක 14,835 දරණ ගැසට් පත්‍රයේ නිවේදනයෙන් ප්‍රකාශ කරන ලද්දාවූද, පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල 39, 40 සහ 41 කාණ්ඩ මේ යෝජනාව ගැසට් පත්‍රයේ පළවන දින සිට සම්මත කර ගැනීමට පෝද්දිවල-නියාගම ගම්සභාව විසින් පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනතේ (261 වැනි පරිච්ඡේදය) 3 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් යෝජනාකර සිටිනු ලැබේ.

කේ. පතිනායක,
පෝද්දිවල-නියාගම ගම්සභාපති.

1969.12.6 වැනි දින,
පෝද්දිවල-නියාගම ගම්සභා කාර්යාලයේ දීය.

1–565—70.1.29 දින අංක 14,891 දරන ගැසට් පත්‍රය

## බත්තරමුල්ල-තලන්ගම සුළු නගර සභාව

### ගෝ ඝාතන ආඥාපනත

මෙහි පහත දැක්වෙන උප ලේඛනයේ සඳහන් නම් ඇති අය විසින් ඒ අයගේ නම් ඉදිරියෙන් සඳහන් ස්ථානයන්හි මස් පිණිස සතුන් මරා විකිණීම සඳහා 1970 වර්ෂයට බලපත්‍ර ඉල්ලුම් කර තිබෙන බවත්, එම බලපත්‍රය නිකුත් කිරීම ගැන බත්තරමුල්ල-තලන්ගම සුළුනගර සභා සීමාව තුළ පදිංචි ඕනෑම කෙනෙකුට තමා ඒ සඳහා විරුද්ධ වන්නේ නම් එය අසවල් කරුණු මත යැයි දැක්වෙන අනු පිටපතින් යුත් ලියවිල්ලකින් මෙම ගැසට් පත්‍රයේ දැන්වීම පළවූ දින සිට දාහතර (14) දවසක් ඇතුළත මා වෙත එවන ලෙස ගෝ ඝාතන ආඥාපනතේ (සංශෝධිත ව්‍යවස්ථා ප්‍රඥප්තියේ 272 අධිකාරය) 7 (2) වැනි වගන්තිය ප්‍රකාර මෙයින් දැනුම් දෙමි.

### උපලේඛනය

| | ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | වෙළඳාම | ස්ථානය |
|---|---|---|---|
| 1. | ඇම්. ඇස්. ඇම්. යූසුප්, 166/11, නාරාහේන්පිට පාර, කොළඹ 8 | හරක් මස්... | වල්පොල මං සන්දිය අසළ, අංගොඩ පාරේ අංක 154 දරණ ස්ථානය |
| 2. | ඇම්. ඇස්. ඇම්. මුභාරක්, 295, දෙමටගොඩ පාර, කොළඹ 9 ... | හරක් මස්... | මාලබේ හන්දිය අසළ, කඩුවෙල පාරේ අංක 781 දරණ ස්ථානය |

බී. එච්. ටී. වල්පොල,
සභාපති,
බත්තරමුල්ල-තලන්ගම සුළු නගර සභාව.

1970.1.10 වැනිදා,
සුළු නගර සභා කාර්‍යාලයය,
බත්තරමුල්ල-තලන්ගම.

1–542—70.1.29 දින අංක 14,891 දරන ගැසට් පත්‍රය

---

## පාතදුම්බර පල්ලේගම්පහ උතුර ගම්සභාව—මහනුවර

### මස් පිණිස සතුන් මැරීම පිළිබඳ ආඥාපනත

මෙහි පහත දැක්වෙන උපලේඛනයේ නම් සඳහන් අයවළුන් විසින් එහි දැක්වෙන ස්ථානවල 1970 වර්ෂයේ මස් කඩ පවත්වාගෙන යාම සඳහා බලපත්‍ර ඉල්ලුම්කර ඇති බවත්, මෙම බලපත්‍ර නිකුත් කිරීම ගැන මහනුවර දිස්ත්‍රික්කයේ පාතදුම්බර පල්ලේගම්පහ උතුර ගම්සභා ප්‍රදේශය තුළ පදිංචි ඕනෑම කෙණෙකුගෙන් විරුද්ධත්වයක් ඇත්නම් එය විස්තර සහිතව ලියවිල්ලකින් පිටපත් දෙකක් සිටිනසේ සකස් කොට මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට දින 14 ක් ඇතුළත මා වෙත ලැබෙන්ට සැලැස්විය යුතු බවත්, මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ (272 වැනි අධිකාරය) 7 (2) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | වෙළඳාම | ස්ථානය |
|---|---|---|
| ඇම්. අයි. රාසික්දීන්, උඩතලවින්න මඩිගේ, කටුගස්තොට ... | ගවමස් කඩය ... | ගලහිටවාපුතැන්න වත්ත, උඩතලවින්න මඩිගේ. |

එච්. ඇම්. බී. උඩුරාවන,
පාත දුම්බර පල්ලේගම්පහ උතුර ගම්සභාවේ සභාපති.

ගම්සභා කාර්‍යාලය,
වාවින්න, වත්තේගම,
1970.1.17.

1–545—70.1.29 දින අංක 14,891 දරන ගැසට් පත්‍රය

---

## නුවරඑළිය දිස්ත්‍රික්කයේ උඩපළාත ගම්සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත දැක්වෙන උපලේඛනයෙහි නම් සඳහන් අය විසින් 1970 වර්ෂයට මස් පිණිස සතුන් මරා, මස් විකිණීම පිණිස බලපත්‍ර ඉල්ලා අයදුම් පත් මා වෙත ඉදිරිපත්කර ඇති බව 272 වැනි අධිකාරිය වන ගෝ ඝාතක ආඥාපනතේ 7 (2) වන වගන්තිය ප්‍රකාර මෙයින් දැනුම් දෙමි.

මෙම බලපත්‍රය නිකුත් කිරීම ගැන උඩපළාත ගම්සභා සීමාව තුළ පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම් ඔහු හෝ ඇ එසේ විරුද්ධ වන්නේ කුමන හේතූන් නිසාද යන වග සඳහන් කර පිටපත් දෙකකින් යුක්ත ලියවිල්ලක් මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට දින 14 ක් ඇතුළතදී මා වෙත ලියා එවීමට බලය තිබෙන බව මහජනයා වෙත මෙයින් දැනුම් දෙමි.

### උපලේඛනය

| අයදුම්කරුගේ නම සහ ලිපිනය | ව්‍යාපාරය | ස්ථානය |
|---|---|---|
| ඇම්. ඒ. අබුසාලි, රාගල, හාල්ග්‍රන්ඔය ... | ... හරක් මස් වෙළඳාම ... | අංක 30, රාගල කඩවීදිය, හාල්ග්‍රන්ඔය |
| ඇම්. ඒ. අබුසාලි, රාගල, හාල්ග්‍රන්ඔය ... | ... එළුමස් වෙළඳාම ... | අංක 8, ස්ටැෆර්ඩ් පාර, හාල්ග්‍රන්ඔය |
| ඇම්. ඒ. පොන්නයියා, සෙල්වාකන්ද, උඩපුස්සැල්ලාව | ... හරක් මස් වෙළඳාම ... | අංක 11, සෙල්වාකන්ද කඩවීදිය, උඩපුස්සැල්ලාව |
| ජේ. ඩී. අබ්දුල්වහබ්, සෙල්වාකන්ද, උඩපුස්සැල්ලාව ... | ... හරක් මස් වෙළඳාම ... | සෙල්වාකන්ද කඩවීදිය, උඩුපුස්සැල්ලාව |

සුනිල් කුමාරදාස,
සභාපති,
උඩපළාත ගම්සභාව.

1970 ජනවාරි 17 දින,
ගම්සභා කාර්‍යාලය,
රාගල–හාල්ග්‍රන්ඔය.

1–546—70.1.29 දින අංක 14,891 දරන ගැසට් පත්‍රය

---

## අම්බලන්ගොඩ නගර සභාව

### 1970 වර්ෂයේ වරිපනම් ලේඛනය

1970 වර්ෂය සඳහා අම්බලන්ගොඩ නගර සභාවේ වරිපනම් ලේඛනය දැනට සූදානම්ව ඇති බවත්, එම ලේඛන නියමිත කාර්‍යාල වේලාවන්හිදී මෙම නගර සභා කාර්‍යාලයේදී පරීක්ෂා කර බැලීම සඳහා තබා ඇති බවත් 255 වැනි අධිකාරිය වූ පළාත් ආණ්ඩු සභා ආඥාපනතේ 166 වැනි වගන්තියේ කියවෙන පරිදි 252 වැනි අධිකාරිය වූ මහ නගර සභා ආඥාපනතේ අංක 235(1) සහ (2) දරණ වගන්තිය අනුව මෙයින් දැනුම් දෙනු ලැබේ.

එස්. ඩී. සීලවතී ද සිල්වා,
අම්බලන්ගොඩ නගර සභාවේ සභාපතිනිය.

1970 ජනවාරි මස 14 වෙනි දින,
අම්බලන්ගොඩ නගර සභා කාර්යාලයේදී ය.

1–578—70.1.29 දින අංක 14,891 දරන ගැසට් පත්‍රය

## මාතලේ දිස්ත්‍රික්කය—මාතලේ මැදසියපත්තු ගම්සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥපනත

මෙහි පහත සඳහන් උපලේඛනයෙහි දැක්වෙන අය එම උපලේඛනයෙහි දැක්වෙන අයුරු සඳහන් ස්ථානයෙහි 1970 වර්ෂයට මස්කඩ පවත්වා ගෙන යැම සඳහා බලපත්‍ර ඉල්වා ඇති බවත් එම බලපත්‍ර නිකුත් කිරීම ගැන මාතලේ මැදසියපත්තු ගම්සභා ප්‍රදේශය තුල පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම් ඒ කුමණ කරුණක් නිසාද යන වග ඇතුලත් ලියවිල්ලක් පිටපත් දෙකකින් යුක්තව මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවන දින සිට දින 14 ක් ඇතුලත ලියා එවීමට බලය තිබෙන බව මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥපනතේ (272 අධිකාරය) වන වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

#### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම | බලපත්‍රයේ ස්වභාවය | ස්ථානය |
|---|---|---|
| ඒ. සී. තයිබුදීන් ... ... ... | හරක් මස් ... ... | උකුවෙල ප්‍රසිද්ධ වෙළඳපොල, අංක 1 කාමරය |

යූ. ඇල්. ඒ. මජීඩ්,
මාතලේ මැදසියපත්තු ගම්සභාපති තැන.

ගම්සභා කායර්‍යාලය,
උකුවෙල, 19.1.70.

1-526—70.1.29 දින අංක 14,891 දරන ගැසට් පත්‍රය

---

## රුවන්වැල්ල සුළු නගර සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥපනත

මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥපනතේ (272 වැනි අධිකාරිය) 17 (1) දරණ වගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලය පිදිදි නියමිත අධිකාරතැනවූ ද, රුවන්වැල්ල සුළු නගර සභාවේ සභාපතිතැන වූද, ඩී. ඇම්. හේමපාල වන මම 1970 වර්‍ෂයේදී පහත දැක්වෙන උප ලේඛනයේ සඳහන් දින වලදී, කෑගලු දිස්ත්‍රික්කයේ රුවන්වැල්ල සුළු නගර සභා ප්‍රදේශ සීමාව තුළ මස් පිණිස සතුන් මැරීම සහ මස් විකිණීම මෙයින් සම්පූර්ණයෙන්ම තහනම් කරමි.

#### උපලේඛනය

ජනවාරි—1, 7, 15, 22, 30.
පෙබරවාරි—4, 6, 14, 17, 21, 28.
මාර්තු—6, 7, 15, 22, 27, 30.
අප්‍රේල්—6, 14, 21, 28.
මැයි—5, 13, 18, 20, 21, 28.
ජූනි—4, 12. 19, 26.
ජූලි—3, 11, 18, 25.
අගෝස්තු—1, 9. 16, 23, 31.
සැප්තැම්බර්—8, 15, 22, 29.
ඔක්තෝබර්—4, 7, 14, 22, 29.
නොවැම්බර්—6, 13, 21, 28.
දෙසැම්බර්—5, 12, 20, 27.

ඩී. ඇම්. හේමපාල,
රුවන්වැල්ල සුළු නගර සභාවේ සභාපති.

1970.1.10 දින,
රුවන්වැල්ල සුළු නගර සභා කාර්යාලයේදීය,

1-554—70.1.29 දින අංක 14,891 දරන ගැසට් පත්‍රය

---

## හිඟුරක්ගොඩ සුළු නගර සභාව

### 272 වැනි අධිකාරය වන ගෝඝාතක ආඥපනත

හිඟුරක්ගොඩ සුළු නගර සභාවේ විශේෂ කොමසාරිස් වූ හත්තොටුව ගමගේ ආනන්ද වන මම 272 වැනි අධිකාරය වන ගෝඝාතක ආඥපණතේ 17 (1) දරණ ඡේදය අනුව මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නියමානුකූල බලධාරියා වශයෙන් හිඟුරක්ගොඩ සුළු නගර සභා පාලන සීමාව ඇතුලත 1970 වර්‍ෂයේ පහත දක්වා ඇති උප ලේඛණයේ සඳහන් දිනවල සත්ව ඝාතනය සහ මස් වෙළඳාම මෙයින් තහනම් කරමි.

#### උපලේඛනය

ජනවාරි 22—පසළොස්වක පෝය දිනය,
පෙබරවාරි 21— පසළොස්වක පෝය දිනය,
මාර්තු 22—පසළොස්වක පෝය දිනය,
අප්‍රේල් 21—පසළොස්වක පෝය දිනය,
මැයි 20—වෙසක් පසළොස්වක පෝය දිනය,
ජූනි 19—පසළොස්වක පෝය දිනය,
ජූලි 18—පසළොස්වක පෝය දිනය,
අගෝස්තු 16—පසළොස්වක පෝය දිනය,
සැප්තැම්බර් 15—පසළොස්වක පෝය දිනය,
ඔක්තෝම්බර් 4—ලෝක සත්ව දිනය,
ඔක්තෝම්බර් 14—පසළොස්වක පෝය දිනය,
නොවැම්බර් 13—පසළොස්වක පෝය දිනය,
දෙසැම්බර් 12—පසළොස්වක පෝය දිනය.

එච්. ජී. ආනන්ද,
විශේෂ කොමසාරිස්,
හිඟුරක්ගොඩ නගරය.

1969 ක්වූ දෙසැම්බර් මස 21 වෙනි දින,
හිඟුරක්ගොඩ නගරයේ,
විශේෂ කොමසාරිස් කායර්‍යාලයේදීය.

1-569—70.1.29 දින අංක 14,891 දරන ගැසට් පත්‍රය

---

## ගෙවල් කුලී සීමා පණත

### කහවත්ත සුළු නගර සභා ප්‍රදේශය

1949 අප්‍රේල් මස 22 වෙනි දින අංක 9,969 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළවූ 1949 යේ ගෙවල් කුලී සීමා රෙගුලාසිවල අංක 3 දරණ රෙගුලාසිය අනුව කෙරෙන දැනුම් දීමයි. (274 පරිච්ඡේදය වන) ගෙවල් කුලී සීමා පණතේ විධිවිධාන අනුව, කහවත්ත සුළු නගර සභා ප්‍රදේශයට සීමිත වූ ගෙවල් කුලී පාලක මණ්ඩලය වෙත එවනු ලබන ඉල්ලුම් පත්‍ර පහත සඳහන් කරනු ලබන ලිපිනයට එවිය යුතුය :—

සභාපතිතුමා,
ගෙවල් කුලී පාලක මණ්ඩලය,
නුගවෙල වතුයාය,
කහවත්ත.

2. මෙම ආඥපනත යටතේ යථෝක්ත මණ්ඩලය වෙත ලැබෙන අයදුම්පත් සලකා බැලීම සඳහා මණ්ඩලයේ සභා රැස්වීම් පහත සඳහන් කරනු ලබන ස්ථානයෙහි පවත්වනු ලැබේ :—

කහවත්ත සුළු නගර සභා කාර්යාලය.

ඒ. ඇල්. අමරසේකර,
කහවත්ත ගෙවල් කුලී පාලක මණ්ඩලයේ සභාපති.

1970. 1. 10 දින,
නුගවෙල වතුයාය, කහවත්ත.

1-539—70.1.29 දින අංක 14,891 දරන ගැසට් පත්‍රය

## ජා-ඇල නගර සභාව

### නගර සභා ආඥාපනතේ (255 වන අධිකාරය)

(255 වන අධිකාරය) නගර සභා ආඥාපනතේ අංක 162 සහ 164 වෙනි වගන්ති යටතේ ජා-ඇල නගර සභාව විසින් 65.5.7 දින ප්‍රසිද්ධ කරන ලද අංක 14,390 දරණ ගැසට් පත්‍රයෙහි පළ වූ උප ලේඛනයෙහි සඳහන් වෙළඳ ව්‍යාපාර සඳහා අය කරන ලද බලපත්‍ර ගාස්තු සංශෝධනය කර, 1970 ජනවාරි මස 1 වෙනි දින සිට ක්‍රියාත්මක වන පරිදි මෙහි පහත දක්වෙන උප ලේඛනයෙහි සඳහන් බලපත්‍ර ගාස්තු පනවා ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඇම්. ජෝශෙප් මයිකල් පෙරේරා,
සභාපති,
ජා-ඇල නගර සභාව.

1969.12.31 වෙනි දින,
ජා-ඇල නගර සභා කාර්යාලයේ දීය.

### උපලේඛනය

| ව්‍යාපාරයේ ස්වභාවය | වාර්ෂික ගාස්තුව | |
|---|---|---|
| | රු. | ශ. |
| 1. ගෝඝාතකයන්ගේ බලපත් ගාස්තුව ... | 10 | 0 |
| 2. මස් කඩ සඳහා-හරක් මස් කඩ ... ... | 100 | 0 |
| එළු මස් කඩ ... ... | 25 | 0 |
| වෙනත් කඩ ... ... | 15 | 0 |
| 3. ආපණ ශාලාවක් තබා ගැනීම සඳහා ... | 25 | 0 |
| 4. බේකරියක් තබා ගැනීම සඳහා ... ... | 40 | 0 |
| 5. තෙල් මෝලක් තබා ගැනීම සඳහා ... | 250 | 0 |
| 6. රට බීම ශාලාවක් තබා ගැනීම සඳහා ... | 150 | 0 |
| 7. බාබර් සාප්පුවක් තබා ගැනීම සඳහා ... | 20 | 0 |
| 8. තේ හෝ කෝපි කඩයක් තබා ගැනීම සඳහා ... | 30 | 0 |
| 9. මාලු කඩයක් තබා ගැනීම සඳහා ... | 15 | 0 |
| 10. කුලු බඩු හෝ මිරිස් යන්ත්‍රානුසාරයෙන් ඇඹරීම: සඳහා ... ... ... | 30 | 0 |
| 11. කිරි පට්ටියක් තබා ගැනීම සඳහා: ගවයින් 3 කට නොවැඩි ... ... ... | 25 | 0 |
| 12. කිරි පට්ටියක් තබා ගැනීම සඳහා: ගවයින් 4 කට හෝ ඊට වැඩි ... ... | 45 | 0 |
| 13. කොප්පරා ගබඩාවක් තබා ගැනීම සඳහා ... | 75 | 0 |
| 14. පෝර ගබඩාවක් තබා ගැනීම සඳහා ... | 25 | 0 |
| 15. පොල් තෙල් ගබඩාවක් තබා ගැනීම සඳහා ගැලොම් 50 අඩු ... ... | 10 | 0 |
| 16. පොල් තෙල් ගබඩාවක් තබා ගැනීම සඳහා: ගැලොම් 50 වැඩි ... ... | 20 | 0 |
| 17. ලොන්ඩරියක් තබා ගැනීම සඳහා ... | 20 | 0 |
| 18. ගිස් ගෝනි ගබඩාකර තබා ගැනීම සඳහා ... | 35 | 0 |
| 19. විදුලි කාර්මික ආයතනයක් තබා ගැනීම සඳහා ... | 35 | 0 |
| 20. මුද්‍රණ කන්තෝරුවක් තබා ගැනීම සඳහා ... | 40 | 0 |
| 21. සවර්ණාභරණ සෑදීම සඳහා ... | 25 | 0 |
| 22. කම්හලක් තබා ගැනීම සඳහා ... | 15 | 0 |
| 23. හාල් මෝලක් හෝ හාල් පැගීම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා ... ... | 50 | 0 |
| 24. ඡායාරූප ශාලාවක් තබා ගැනීම සඳහා ... | 30 | 0 |
| 25. රා එක්කාසු කරන ස්ථානයක් සඳහා ... | 35 | 0 |
| 26. බීඩි සෑදීමේ කර්මාන්ත ශාලාවක් තබා ගැනීම සඳහා ... ... ... | 25 | 0 |
| 27. අඟුරු ගබඩාවක් තබා ගැනීම සඳහා: (හොන්ඩර 5 ට වැඩි) ... ... | 10 | 0 |
| 28. වොල්කනයිසින් කරන ස්ථානයක් පවත්වාගෙන යාම් සඳහා ... ... | 10 | 0 |
| 29. පැණි ගබඩාවක් තබා ගැනීම සඳහා (ගැලොම් 10 ට වැඩි) ... ... ... | 35 | 0 |
| 30. දුව භාණ්ඩ ගබඩාවක් තබා ගැනීම සඳහා ... | 100 | 0 |
| 31. බයිසිකල් අළුත් වැඩියා කරන ස්ථානයක් තබා ගැනීම සඳහා ... ... | 10 | 0 |
| 32. දර ගබඩාවක් තබා ගැනීම සඳහා ... ... | 15 | 0 |
| 33. මෝටර් රථ අළුත්වැඩියා කරන හෝ සර්විස් කරන ස්ථානයක් සඳහා ... ... | 35 | 0 |
| 34. පුනක්කු ගබඩාවක් තබා ගැනීම සඳහා (හොන්ඩර් 5 ට වැඩි) ... ... | 10 | 0 |
| 35. අවමංගල්‍ය භාණ්ඩ සෑදීම හා ගබඩා කිරීම සඳහා ... | 15 | 0 |
| 36. ගෘහභාණ්ඩ නිපදවීම් හා ගබඩා කිරීම සඳහා ... | 30 | 0 |
| 37. හිස් බෝතල් ගබඩා කිරීම සඳහා ... | 30 | 0 |
| 38. සිමෙන්ති, සායම් වර්ග සහ වාර්නිස් ගබඩා කිරීම සඳහා (හොන්ඩර් 5 ට වැඩි) ... ... | 20 | 0 |
| 39. ලී ඉරීම සඳහා: යන්ත්‍ර සහිත ... ... | 10 | 0 |
| 40. ලී ඉරීම සඳහා: යන්ත්‍ර රහිත ... ... | 5 | 0 |
| 41. හාල් ගබඩාවක් තබා ගැනීම සඳහා ... | 150 | 0 |
| 42. සබන් ගබඩාවක් තබා ගැනීම සඳහා (හොණ්ඩර 5 ට වැඩි) ... ... ... | 15 | 0 |
| 43. හුණු පෝරණුවක් සඳහා ... ... | 15 | 0 |
| 44. වාත්තු කරන වැඩ පොලක් පවත්වා ගෙන යාම සඳහා ... ... ... | 125 | 0 |
| 45. කොප්පරා මඩුවක් තබා ගැනීම සඳහා ... | 25 | 0 |
| 46. පාවිච්චි කරන ලද මෝටර් රථ විකිණීමේ ස්ථානයක් සඳහා ... ... ... | 100 | 0 |
| 47. කරවල ගබඩාවක් තබා ගැනීම සඳහා (හොන්ඩර 5 ට වැඩි) ... ... | 10 | 0 |
| 48. පළතුරු ගබඩාවක් සඳහා ... ... | 6 | 0 |
| 49. කොහු මෝලක් තබා ගැනීම සඳහා ... | 50 | 0 |
| 50. වෑල් ඩින් වැඩපලක් සඳහා ... ... | 15 | 0 |
| 51. දඩ මස් විකිණීම සඳහා ... ... | 50 | 0 |
| 52. කුකුලන් විකිණීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාමට ... ... ... | 10 | 0 |
| 53. කිරි වෙළඳාම පවත්වාගෙන යාම සඳහා ... | 5 | 0 |

1–546—70.1.29 දින අංක 14,891 දරන ගැසට් පත්‍රය

---

## බින්තැන්න ගම් සභාව—මහියංගනය

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත උපලේඛනයෙහි සඳහන් අය විසින් එකී ස්ථානයේ 1970 පෙබරවාරි මස 7 වන දින සිට 1970 දෙසැම්බර් මස 31 වන දින දක්වා මස් පිණිස සතුන් මරා විකිණීමට බලපත්‍රයක් ඉල්වා අයදුම් පතක් මා වෙත ඉදිරිපත් කර ඇති බව මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ 201 වන පරිච්ඡේදයේ 1947 අංක 44 දරන සංශෝධිත ආඥාපනතේ 6 වන වගන්තියෙන් සංශෝධනය කරන ලද 7 වන වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

එකී බලපත්‍ර නිකුත් කිරීම ගැන බදුල්ල දිස්ත්‍රික්කයෙහි, බින්තැන්න ගම්සභා සීමාව තුල පදිංචි අයෙක් විරුද්ධ වන්නේ නම්, එය කුමන කරුනක් නිසාද යන වග සඳහන් ලියවිල්ලක් පිටපත් දෙකක් සහිතව මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පලවූ දින සිට 14 දිනක් ඇතුලත මා වෙත එවිය යුතුයි.

### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම | ස්ථානය | වෙළඳාම |
|---|---|---|
| ඌනා මොහොම්මදු ඉස්මයිල් ... | පහරගම්මන ... | හරක් මස් වෙළඳාම |

බී. එම්. එම්. සුදුබණ්ඩා,
සභාපති, බින්තැන්න ගම්සභාව.

1970.1.9 වන දින,
මහියංගන,
බින්තැන්න ගම්සභා කාර්යාලයේදීය.

1–559—70.1.29 දින අංක 14,891 දරන ගැසට් පත්‍රය

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපැලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව, එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුලත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවට ද හේතු වන බව සලකන්න.

ආණ්ඩුවේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියළුම දායක මුදල් කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙලින්ම ගෙවිය යුතුයි.

### උපලේඛනය

**1970**

| මාසය | පළ කිරීමේ දිනය | | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | | |
|---|---|---|---|---|---|---|
| ජනවාරි | 70. 1. 2 | සිකුරාද | 69.12.26 | සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 1. 9 | සිකුරාද | 70. 1. 2 | සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 1.16 | සිකුරාද | 70. 1. 8 | බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | 70. 1.23 | සිකුරාද | 70. 1.16 | සිකුරාද | පෙ.ව. | 12.00 |
| | 70. 1.29 | බ්‍රහස්පතින්ද | 70. 1.21 | බදාද | පෙ.ව. | 12.00 |
| පෙබරවාරි | 70. 2. 5 | බ්‍රහස්පතින්ද | 70. 1.28 | බදාද | ප.ව. | 3.30 |
| | 70. 2.13 | සිකුරාද | 70. 2. 5 | බ්‍රහස්පතින්ද | පෙ.ව. | 12.00 |
| | 70. 2.20 | සිකුරාද | 70. 2.13 | සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 2.27 | සිකුරාද | 70. 2.20 | සිකුරාද | පෙ.ව. | 12.00 |
| මාර්තු | 70. 3. 5 | බ්‍රහස්පතින්ද | 70. 2.27 | සිකුරාද | පෙ.ව. | 12.00 |
| | 70. 3.13 | සිකුරාද | 70. 3. 5 | බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | 70. 3.20 | සිකුරාද | 70. 3.13 | සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 3.26 | බ්‍රහස්පතින්ද | 70. 3.20 | සිකුරාද | ප.ව. | 3.30 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1969 දෙසැම්බර් 12 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණදෙපාර්තමේන්තුව, කොළඹ.

ලංකාණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි